# STATUS AND TRENDS IN CONSERVATION AND MANAGEMENT OF ELEPHANTS IN SRI LANKA: AN ANALYSIS OF SOCIAL MEDIA BEHAVIOUR

G.G.D. Sewwandi[1] and M.Karunarathne[2]

**Abstract**

Elephants are one of the major wildlife attractions in Sri Lanka. It has been revered in Asia for centuries and plays a vital role in the continent’s culture, religion, and war. They also play a critical role in maintaining forests in the region. Today, Elephants are considered to be an endangered species, just like many species of animals that became extinct on Earth hundreds of thousands of years ago. The human-elephant conflict in Sri Lanka is currently a strong socio-economic and conservation challenge. Social media groups and pages posting environmental news in Sri Lanka can be seen disclosing various facts about elephant-human conflict, conservation and management trends and situations in Sri Lanka. The main objective of this paper was to identify the status and trends of elephant conservation and management in Sri Lanka. Also, the importance of human-elephant conflict in Sri Lankan social media and its content, the purpose and results of posting on social media, and the impact of social media news on reducing human-elephant conflict are also identified here. For this, a secondary source of data, social media, is selected, and data is collected through 20 selected pages and 20 groups. It analyzes the number of news items published in these during the last year, their content, accuracy, the language used, the purpose and nature of reporting, and the situations that occurred after reporting. Reported news is analyzed in a number of different areas. Due to the unsustainable development processes in the country, environmental scientific factors, and political instability, this elephant-human conflict has escalated. For this, the study has revealed that the expansion of elephant migration routes, correct conservation strategies, rules, and the use of technology are essential.

**Keywords:** Conservation, Human Elephant Conflict, Management, Social Media, Status and Trends

[1] Undergradute, Department of Geography, Ruhuna University of Sri Lanka
Email: danushkasewwandi98@gmail.com https://orcid.org/0009-0001-7731-8231

[2] Senior Lecturer, Department of Geography, Ruhuna University of Sri Lanka
Email: msmanjula@geo.ruh.ac.lk https://orcid.org/0000-0003-0035-424X

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by- sa/4.0/

# ශ්‍රී ලංකාවේ අලි සංරක්ෂණය සහ කළමනාකරණ තත්ත්ව සහ ප්‍රවණතාඃ සමාජ මාධ්‍ය හැසිරීම් පිළිබඳ විශ්ලේෂණයක්


**සාරසංක්ෂේපය**

අලියා යනු දැනට ගොඩබිම ජීවත්වන විශාලතම සත්ත්වයාය. ආසියානු අලියා (*Elephas maximus*) දැනට ලොව තර්ජනයට ලක්ව ඇති ප්‍රධාන සත්ත්ව විශේෂයන් අතරින් එකකි (Fernando, et al. 2022). ඉන්දියාව, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ තවත් අග්නිදිග ආසියානු රටවල් කීපයකටම ආවේණික වූ ආසියාවේ විවිධ රටවලට ආවේණික අලි විශේෂයකි. මෙම අලි අප්‍රිකානු අලි හා සසඳන විට ඔවුන් ප්‍රමාණයෙන් කුඩා වන අතර සුවිශේෂී ලෙස කුඩා කන් සහ වඩා වටකුරු පිටුපසකින් සමන්විත වේ. ආසියාතික අලි ඉතා බුද්ධිමත් සහ සමාජශීලී සතුන් වන අතර, ඔවුන් ශක්තිමත් සමාජ බැඳීම් සහ සංකීර්ණ හැසිරීම් රටාවන් සඳහා ප්‍රසිද්ධ ය. ඔවුන් සියවස් ගණනාවක් පුරා ආසියානු සංස්කෘතීන්හි අනිවාර්ය අංගයක් වී ඇති අතර, කෘෂිකර්මාන්තය, වන වගාව, ආගමික සංකේතවල සිට වැඩ කරන සතුන් දක්වා විවිධ භූමිකාවන් ඉටු කරයි. දැනට වන අප්‍රිකානු අලි සංඛ්‍යාව (*Loxodonta africana*) 470,000 ත් 630,000 ත් අතර වේ (Blanc, et al, 2007). ඔවුන් වසර 100 කට පෙර මහාද්වීපය පුරා සිටි මිලියන 5 කට අධික සතුන්ගෙන් උප සහරා කලාපවල ඛණ්ඩනය වූ වාසස්ථානවලට දැනට පවතින සංඛ්‍යාව දක්වා අඩු වී ඇත. ඇත් දළ සහ මස් දඩයම් කිරීම අතීතයේ පරිහානියට ප්‍රධාන හේතුවක් වූ අතර, වාසස්ථාන අහිමි වීම වර්තමානයේ ඔවුන්ගේ අඛණ්ඩ පැවැත්මට ඇති විශාලතම තර්ජනයයි (Karunaratne, 2019). කෙසේ වෙතත්, පරස්පර විරෝධී ලෙස, සමහර රටවල අලි සංඛ්‍යාව වැඩි වෙමින් පවතින අතර ඔවුන්ගේ වාසස්ථාන හායනය වැළැක්වීම සඳහා පාලනය කිරීමට අවශ්‍ය විය හැකිය. සෑම භූගෝලීය ප්‍රදේශයක හෝ භූමියක, මිනිසා සහ අලියා එහි විවිධ පරිණාමීය ක්‍රියාවලීන් තුළ ජීවත් වී ඇති බවට සාක්ෂි මගින් පෙන්වා දී ඇත (පරාක්‍රම, 2006). වාසස්ථාන අහිමි වීම, මිනිස්- වනජීවී ගැටුම් සහ දඩයම් කිරීම වැනි තර්ජනවලට මුහුණ දෙන බැවින්, ආසියානු අලි ඇතුන් ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ උත්සාහයන් අඛණ්ඩව පවතී. අනාගත පරම්පරාවන් සඳහා මෙම ඇදහිය නොහැකි විශේෂයේ පැවැත්ම සහතික කිරීම සඳහා සංවිධාන සහ රජයන් එක්ව කටයුතු කරනු දැකිය හැකිය.


**හැඳින්වීම**

***ශ්‍රී ලංකාවේ අලි ඇතුන්***

අලි ඇතුන්ට ඉතා ව්‍යුහගත සමාජ ක්‍රමයක් ඇති අතර පිරිමි සහ ගැහැණු අලි ඇතුන්ගේ සමාජ ජීවිතය බෙහෙවින් වෙනස් වේ (Katupotha & Sumanarathna, 2016). කාන්තාවන් තම මුළු ජීවිතයම මව්වරුන්, දියණියන්, සහෝදරියන් සහ නැන්දාගෙන් සමන්විත පවුල් කණ්ඩායම්වල ගත කරන අතර වැඩිහිටි පිරිමින් මූලික වශයෙන් හුදකලා ජීවිත ගත කරයි (Katupotha & Sumanarathna, 2016). සාමාන්‍ය ආසියානු අලි පවුල් රංචුවකට 100-1,000 $kg^2$ නිවහනක් ඇත, නමුත් ශ්‍රී ලංකාවේ එය 50-150 $km^2$ දක්වා සීමා වේ (Shaffer et al. 2019; Sukumar, 2006). නිවාස පරාසයේ ප්‍රමාණය ආහාර, බීමට සහ නෑමට ජලය සහ කලාපයේ නවාතැන් මත රඳා පවතී (Sukumar, 2006). සමෙන් ජලය වාෂ්ප වීම හේතුවෙන් අලි ඇතුන් ප්‍රධාන වශයෙන් සිසිලනය සඳහා ජලය මත රඳා පවතී (Dunkin et al. 2013; Williams, 2019). වඩාත් මෑතක දී, මාර්ග, වැටවල් සහ ඇළ මාර්ග වැනි සංවර්ධන ක්‍රියාකාරකම් නිසා අලි ඇතුන්ගේ නිවහනට බාධා පැමිණ ඇත (Fernando et al. 2011).

අලියාගේ ආහාර දිරවීමේ පද්ධතිය අකාර්යක්ෂම වන අතර, මොවුන්ගේ ආහාර ගැනීමෙන් 40-50% ක් දිරවා නොගත් ද්‍රව්‍ය ලෙස ගමන් කරයි (Kingdom 2021; Sukumar 2006; Williams 2019). එහි ප්‍රතිඵලයක් වශයෙන්, අලියා දිනකට ආසන්න වශයෙන් පැය 19ක් පමණ ආහාර ගනිමින් අඛණ්ඩ සහ බහුල ආහාර සහ ජල සැපයුමක් සොයමින් සිටියි. මොවුන්ගේ ආහාර වේල දැඩි ලෙස ශාකභක්ෂක වන අතර දෛනික ආහාර අවශ්‍යතාවය සිරුරේ බරින් 10%ක් පමණ වේ (Krishnan & Braude 2014; Sitompul et al. 2013). බොහෝ අලි ඇතුන් දිනකට ආහාර 100-150 kg ක් පරිභෝජනය කරයි, පරිණත වැඩිහිටි පිරිමින්ට ගැහැණු සතුන්ට වඩා වැඩි ආහාර අවශ්‍ය වේ (Fernando et al. 2023).

වර්තමානයේ උග්‍රව ඇති අලි මිනිස් ගැටුමට අතීතයේ ජනගහන වර්ධනය සේම වනාන්තර විනාශය ද බෙහෙවින් බලපා ඇත. ශ්‍රී ලංකාවේ රජයන් විසින් අනුගමනය කළ සමාජ ආර්ථික හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති වන ආවරණය විනාශ වීමට හේතු සාධක වූ බව කිව හැක. 1881 දී ආසන්න වශයෙන් 85% ක් වූ වන ආවරණය ක්‍රමයෙන් 28% ක් දක්වා අඩු වූ බව 1989 වර්ෂයේ දත්තවලින් පැහැදිලි වේ. එය අද වන විට 15% ක අවම අගයක් ගනී (තිලකරත්න, 2000). දැනට වසර 100 කට පෙර අලි ඇතුන්ට කැලයෙන් පිටතට ඒමට කිසිදු

අවශ්‍යතාවක් නොවීය. එහෙත්, අද තත්ත්වය හාත්පසින්ම වෙනස් වී ඇත. අතීතයේ සිංහරාජයේ විශාල අලි රංචුවක් වාසය කලත් 2015 පමණ වන විට එය අලි දෙදෙනා දක්වා අඩු විය. මෑතකදී නිල වශයෙන් වාර්තා වූයේ පිරිමි අලි දෙදෙනෙකු පමණි. මිනිසුන්ගේ ක්‍රියාවන් මතම ප්‍රචණ්ඩ වූ අලි දරුණු හැසිරීම් පෙන්වූ ආකාරය පසුගිය දිනවලදී අනාවරණය විය (Bandara & Tisdell, 2005).

මුල් ගල් විශේෂයක් සේම වනාන්තරවල ප්‍රධාන සත්ත්ව කොට්ඨාසයක් වන අලි ඇතුනගේ පැවැත්මට, ක්‍රම ක්‍රමයෙන් වන හායනය බලපෑම් එල්ල කර ඇත. 2007 දී ලෝක සංරක්ෂණ සංගමය ප්‍රකාශයට පත්කළ රතු දත්ත පොතට අනුව වසරකට මෙරටට අහිමි වන වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 33,000 කි (කරුණාරත්න, 2011). අලි ඇතුන්ගේ වාසස්ථාන හා පාරම්පරික වන කලාප අහිමි වීමට මෙන්ම, අලි මිනිස් ගැටුම උග්‍ර වීමට මෙරට රජයන් විසින් ක්‍රියාවට නන්වන ලද කෘෂි ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් බලපෑම් සිදුකර ඇත (Pieris, 1976).

දේශීය කෘෂි ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් 1935 දී හඳුන්වා දෙනු ලැබූ ඉඩම් සංවර්ධන පනත, ඉඩම් පරිහරණය, කෘෂි ආර්ථිකය හා ගොවි ජනපද ක්ෂේත්‍රවල ප්‍රබල වෙනස්කම් රාශියක් සිදුකරන ලදී. ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව ඉඩම් අහිමි වූවන්ට මෙන්ම වෙනත් අයට කෘෂිකර්මාන්තය නගා සිටුවීම පිණිසත්, දරිද්‍රතාව, විරැකියාව අවම කිරීමටත් රජයේ ඉඩම් ජනතාවට ලබාදී ගොවි ජනපද පිහිටුවිය. ගල් ඔය, ගිරිතලේ, මිහින්තලේ, රාජාංගනය, මහඉලුප්පල්ලම යනාදිය මෙසේ ආරම්භ කෙරුණි (Gamage & Aheeyar, 1998). මේ සඳහා විශාල වශයෙන් කැලෑ එළි කළ අතර එමගින් සතුන්ගේ වාසස්ථාන ඛණ්ඩනය විය. විශාල වනාන්තර වෙනුවට තැනින් තැන කුඩා කැලෑ ඉතිරි විය. අලි ඇතුන් තම ජීව විද්‍යාත්මක ජවය, ඥානය, මිනිස් ක්‍රියාකාරකම්වලට එරෙහිව භාවිතා කිරීමට පෙළඹී ඇත. මෙය අලි මිනිස් දෙපාර්ශවය අතර ද්වන්ධ සටනක් නිර්මාණය කිරීමට හේතු භූත වූවා යැයි කිව හැක. මෙහිදී දෙපාර්ශවයටම හානි සහ පරාජයන් සිදුවූවත්, දෙපාර්ශවයම අඛණ්ඩව තම පැවැත්ම සඳහා අරගලයක යෙදී සිටිණු නිරීක්ෂණය කළ හැක.

වන ජීවී සංක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව සාමාන්‍යයෙන් මෙම ගැටුම හේතුවෙන් වාර්ෂිකව දළ වශයෙන් මිනිස් ජීවිත 80 ක් පමණ ද වන අලි 250 ක් පමණද අහිමි වේ. ඒවා කෙතරම් බිහිසුණු ද යන වග විවිධ ප්‍රදේශවලින් වාර්තා වන පුවත් අනුව පැහැදිලි වේ (පරාක්‍රම, 2006). වන අලින්ගෙන් මිනිසුන්ට වන හානි ලෙස තුවාල, මරණ සිදුකිරීම , නිවාස හා දේපල හානි, වගා විනාශ කිරීම දැක්විය හැකිය. අලි මිනිස් ගැටුම්වලදී වැඩිම ජීවිත හානි ප්‍රමාණයක් හා වා අලින්ගේ පහරදීම්වලට ලක්වී ඇති ප්‍රදේශය වන්නේ මහවැලි කලාපයයි (පරාක්‍රම, 2006). වැඩිම දේපල හානි සහ අලි මරණ වයඹ පළාතෙන් වාර්තා වේ.

වර්තමානයේ වර්ධනය වී ඇති අලි මිනිස් ගැටුමට ප්‍රධානම හේතුව වනුයේ ආර්ථිකය මුල් කරගත් සංවර්ධන ව්‍යාපෘතීන්ය. අලි මිනිස් ගැටුම වියළි කලාපයේ පවුල් ජීවිත කෙරෙහි බලපාන ආකරය පිලිබඳ විමසීමේදී කෘෂිකාර්මික ජීවිකාව හා දරිද්‍රතාව කෙරෙහි බලපාන බව පෙනේ. (අතපත්තු, 2011). මෙම පර්යේෂණ සාහිත්‍ය පරීක්ෂා කිරීමේ දී අනාවරණය වන්නේ නූතන ගෝලීයකරණය, සංවර්ධන ව්‍යාපෘති හා නවීන කෘෂිකාර්මික ක්‍රමෝපායන් අනුගමනය කිරීම ගැටුමේ පාදක සාධක වී ඇති බව යි. මෙහිදී තවදුරටත් සමාජ මාධ්‍ය හැසිරීම් පිළිබඳ විශ්ලේෂණය ක් සිදුකරමින්, ශ්‍රී ලංකාවේ අලි සංරක්ෂණය සහ කළමනාකරණ තත්ත්ව සහ ප්‍රවණතා හඳුනාගැනීම සිදු කිරීමට බලාපොරොත්තු වේ.

***ගැටලු ප්‍රකාශනය***

ශ්‍රී ලංකාවේ පරිසර ප්‍රවෘත්ති පලකරන සමාජ මාධ්‍ය කණ්ඩායම් (Groups) සහ පිටු (Pages) ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම වාර්තා කිරීමේ ස්වභාවය කෙබඳු ද? සහ එය අලි ඇතුන් සංරක්ෂණය කෙරෙහි බලපා තිබෙන්නේ කෙසේ ද?

***අරමුණු***

- අලි මිනිස් ගැටුම ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය වල ප්‍රමුඛ වන්නේ ඇයිද යන්න සහ සමාජ මාධ්‍ය පුවත්වල අන්තර්ගතය හඳුනා ගැනීම
- සමාජ මාධ්‍ය ඇසුරින් ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුමේ තත්ත්ව සහ ප්‍රවනතා හඳුනා ගැනීම
- අලි මිනිස් ගැටුම සමාජ මාධ්‍යවල පල කිරීමේ අරමුණු සහ එහි ප්‍රතිඵල හඳුනා ගැනීම
- අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සමාජ මාධ්‍ය පුවත්වල බලපෑම කුමක්ද යන්න හඳුනා ගැනීම

**ක්‍රමවේදය**

ද්විතියීක දත්ත මත පදනම්ව දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලිය සිදුකරයි. මෙහිදී, ද්විතීයික මූලාශ්‍රය ලෙස සමාජ මාධ්‍ය යොදා ගනියි. මෙම පර්යේෂණයේදී සමාජ මාධ්‍ය ලෙස ෆේස්බුක් පමණක් යොදාගන්නා අතර පසුගිය

වසරක කාලයකදී සංවිධාන, පුද්ගලයින් විසින් නඩත්තු කරනු ලබන සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය පිටු, කණ්ඩායම්වල පල වූ පුවත් මෙහිදී විශ්ලේෂණය කරනු ලබයි. මේ සඳහා මුහුණු පොතේ පිටු 20 ක් හා කණ්ඩායම් 20 ක් තෝරාගනු ලැබිණි. මෙහිදී, පලවූ පොස්ට් සංඛ්‍යාව, ඒවායේ අන්තර්ගතය, නිවැරදිතාව, භාෂා භාවිතය, වාර්තා කිරීමේ අරමුණ සහ ස්වභාවය, මේවාට ලැබුණ ප්‍රතිචාර සහ වාර්තා කිරීමෙන් පසු ඇති වූ තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. මීට අමතරව, අලි සංක්‍රමණ හා කළමනාකරණ තත්ත්ව සහ ප්‍රවණතා විවිධ උප මාතෘකා ඔස්සේ සාකච්ඡාවට බඳුන් කිරීමට බලාපොරොත්තු වේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

දිනෙන් දින සිදුවන වනාන්තර එළි කිරීම නිසාත්, මිනිසුන් විසින් වනාන්තර ආශ්‍රිත ප්‍රදේශවල තම වාසස්ථාන, වගාබිම් සාදාගැනීම හේතුවෙන් අද වන විට අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් අලින්ගේ ස්වාභාවික වාසස්ථාන ද බොහෝ ලෙස සීමා වී ඇත. අලින් පලවා හැරීමට මිනිසුන් විවිධ උපක්‍රම භාවිතා කරයි. සමාජ මාධ්‍යයක් වන මුහුණු පොතේ පිටු සහ කණ්ඩායම් ඔස්සේ වසරක කාලයක් නිරීක්ෂණය කරන විට අලි මිනිස් ගැටුම සහ කළමනාකරණය සඳහා භාවිතා කර ඇති විවිධ ක්‍රමෝපායන් දැකගන්නට ලැබුණි. මෙහිදී තෝරා ගත් පිටු සහ කණ්ඩායම් පහත පරිදි වේ.

***වගු අංක 01 : තෝරා ගත් පිටු සහ කණ්ඩායම්***

| පිටු (Pages) | කණ්ඩායම් (Groups) |
|---|---|
| 1. Voice for Elephants Sri Lanka | 1. Elephant Lovers |
| 2. හීලෑ අලි ඇත්තු - Sri lankan Tamed Elephants | 2. Group Elephant Lovers |
| 3. හස්ති පරපුරේ අභිමානය | 3. Habitats for Elephants |
| 4. අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු | 4. Sri Lanka Road Elephant Research |
| 5. අලි මිනිස් ගැටුමට විසඳුමක් | 5. Living with Elephants |
| 6. පරිසර ත්‍රස්තවාදියා | 6. The Elephant appreciation Society (TEAS) |
| 7. හස්ති රාජ පරපුර | 7. Manik Elephant Protection Foundation |
| 8. Elephant Soul | 8. Elephant Lovers Club |
| 9. The අලියා - Elephant | 9. The Voice for Elephants |
| 10. Thambapanni | 10. Ali Wadiya - අලි වාඩිය |
| 11. Sri Lanka Elephant | 11. අලි මිනිස් ගැටුමට විසඳුමක් |
| 12. The breath - හුස්ම | 12. Sri Lankan Elephants |
| 13. Newsfirst.lk | 13. ගජ මිතුරෝ |
| 14. Everything for animals | 14. ශ්‍රී ලංකාවේ අලි සහ ඇතුන් |
| 15. හස්ති රාජ - Hasthi Raja | 15. Sri Lankan Elephant Protectors |
| 16. Ceylon Tuskers | 16. අලි ඇතුන් සුරකිමු |
| 17. අලි රකින මිනිස් දම්වැල | 17. Voice for Elephants |
| 18. Centre for Environmental Justice | 18. Save Sri Lankan Elephants |
| 19. මිනිස් ජීවිත, වන අලින්, වනජීවීන් හා බෝග වගාවන් සුරැකීමේ සංවිධානය | 19. Mitigating Human Elephant Conflict |
| 20. Save Elephant | 20. Advocate for Sri Lanka Wild Elephants - අපේ වන අලි වෙනුවෙන් සටන් කරමු |

(මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත, 2023)

පොදුවේ ගත් කල මෙම අලි මිනිස් ගැටුම විශාල ලෙස මෙම මූලාශ්‍ර දෙකහිම ප්‍රබලව සාකච්ඡාවට බඳුන් වී තිබුණි. විශ්ලේෂණයේ පහසුව තකා මෙම සිද්ධි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ උප වර්ගීකරණය කරන ලදී. ප්‍රථමයෙන්ම අලි මරණ කෙරෙහි අවධානය යොමු කළ අතර දුම්රියේ ගැටීම, ඇළ මාර්ගවල වැටීම, මඩේ ගිලීම, වගා ළිං වල වැටීම, අලි අගල්, වස දීම, විදුලි සැර වැද්දවීම, වෙඩි තැබීම්, හක්කපටස්, කඳන් තුවක්කු, ස්වභාවික හේතු ලෙස ඒවා වර්ග කරන ලදී.

වන අලි මරණ සහ ඒ පිළිබඳ වාර්තා

***ප්‍රස්ථාර අංක 01:වන අලි මරණ සහ ඒ පිළිබඳ වාර්තා***




(මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023)

***හක්ක පටස් නිසා සිදුවන අලි මරණ***

අලි මරණ පිළිබඳව පලවී ඇති වාර්තා අනුව වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ හක්ක පටස් මගින් වන අලි මරා දැමීම සම්බන්ධවයි. 2023 අගෝස්තු 19 වන දින Everything for Animals පිටුවෙහි වාර්තා වී ඇති ආකාරයට නවගත්තේගම මහ මැද්දෑවේ හක්කපටස් පිපිරීමෙන් අසරණව සිට වයස මාස හතක අලි පැටවෙක් මියගොස් තිබේ (Everything for Animals, 2023). කුඹුරට ගිය ගොවීන් පිරිසක් පසුපස පැමිණ අසල නිවසකට ගොස් මිදුලේ වැටී විලාප නැගූ මාස හතක් පමණ වන මෙම අලි පැටවා දැඩි ලෙස අසාධ්‍ය ව සිට මිය ගොස් ඇති බව මෙහි වාර්තා වී තිබුණි.

The breath - හුස්ම පිටුවෙහි 2023 සැප්තැම්බර් 2 වන දින මෙවැනි ම වූ තවත් සිදුවීමක් වාර්තා වෙයි (The breath, 2023). ඒ අනුරාධපුරේ දී හමු වූ වයස අවුරුදු පහක අලි පැටවෙකි. පෙර දින වනජීවී නිලධාරීන් ප්‍රතිකාර කිරීමට රැගෙන යාම සඳහා ට්‍රැක්ටර් රථයක පටවා ගැනීමට උත්සාහ කළත්, පැටවා කලබල කිරීම නිසා පසුදින අනුරාධපුර කලාප කාර්යාලයෙන් ලොරියක් ගෙනැවිත් රැගෙන යාමේ අදහසින් වැව් ඉස්මත්තේ බැඳ තබා තිබූ අතර පසුදින උදෑසනම අලි පැටවා මරණයට පත්ව ඇත. මෙසේ හක්ක පටස් වලට වැඩි වශයෙන් ගොදුරුව ඇත්තේ වයස අවුරුදු 5-15 ත් අතර වයස්වල පසුවන අලි ඇතුන් බව මෙම සිද්ධි අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

***දුම්රියේ ගැටීම නිසා සිදුවන අලි මරණ***

දුම්රියේ ගැටීම නිසා අනතුරු සිදුවීම වර්තමානයේ සුලබව කතාබහට ලක් විය. පරිසර ත්‍රස්තවාදියා පිටුවෙහි වාර්තා වී ඇති ආකාරයට කන්කසන්තුරේ-කොළඹ දුම්රියේ ගැටී වන අලි හතරක් මරණයට පත්ව ඇත (පරිසර ත්‍රස්තවාදියා, 2023). තවද 2023/09/28 දින ගල්ගමුව හා පලුගස්වැව ප්‍රදේශයේ දී දුම්රියේ වැදී සද්දන්තයන් හයක් දුම්රියට බිලි වූ බව පරිසර ත්‍රස්තවාදියා පිටුව වාර්තා කර ඇත. ගල්ගමුව නගරයට ආසන්නව පිහිටි තේක්ක කැලය ප්‍රදේශයේ දී වන අලි රංචුවක් දුම්රියේ ගැටීමෙන් එහි සිටි අලින් සිව් දෙනෙකු මියගොස් තිබේ.

අනෙක් අනතුර සිදුව ඇත්තේ කොළඹ කොටුව සිට පොළොන්නරුව බලා ධාවනය වූ මීනගයා දුම්රියට කැකිරාව හා පලුගස්වැව අතර ප්‍රදේශයේදී වන අලි රංචුවක් ගැටීමෙනි.

***විෂ ශරීරගත වීම නිසා සිදුවන අලි මරණ***

විෂ ශරීරගත වීම නිසා සිදු වූ අලි මරණ පිළිබඳව Newsfirst.lk පිටුවෙහි 2023/09/19 වන දින පුවතක් පළවිය. සතුන් දඩයම් කිරීමට යෙදූ වස වර්ගයක් ශරීරගත වීමෙන් කුරුණෑගල ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොත්මලේ ප්‍රදේශයේ දී කෙනරක් මියගොස් ඇත. ප්‍රතිකාර කළ ද වස නිසා ශරීර අභ්‍යන්තරයට වී තිබූ හානිය බරපතළ බැවින් මෙම කෙනර පසුදා සවස මියයන ලදී (Newsfirst.lk, 2023). තවද වස දීම නිසා කුබිලයිබාන් නම් ඇතා ද ජීවිතක්ෂයට පත්වූ බව Voice for Elephants Sri Lanka පිටුවෙහි වාර්තා වී ඇත .

***ස්වභාවික හේතු නිසා සිදුවන අලි මරණ***

2023/09/14 වන දින The Voice for Elephants කණ්ඩායමෙහි සියඹලාව ගමේ ඇළ මාර්ගයක වැටී සිටි අලියෙක් මිය යෑමේ සිද්ධියක් වාර්තා කර ඇත. තවද 2023 අප්‍රේල් 04 වන දින පොලොන්නරුව සිරිපුර නවගහ ඇල වෙල්යායක ඇළ මාර්ගයක් තුල සිරවීමෙන් මියගිය අවුරුදු පහක අලි පැටවකු පිළිබඳව වාර්තා කරයි (The Voice for Elephants, 2023).

පොලොන්නරුව අරලගංවිල වෙල් යායක ජලය සොයා ආ මාස තුනක අලි පැටවකු ද මඩේ එරී ජීවිතක්ෂයට පත්ව ඇති බව අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු පිටුව වාර්තා කර ඇත (අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු, 2023).

***වෙඩි තැබීම් නිසා සිදුවන අලි මරණ***

වෙඩි තැබීම් නිසා පීඩා විඳි අලි ඇතුන් පිළිබඳව සඳහන් කිරීමේදී මාදුරු ඔය ජාතික වනෝද්‍යානයේ දී හිසට වෙඩි තබා ඝාතනය කළ අවුරුදු 35 ක අලියා පිළිබඳ සිදුවීම දැක්විය හැක. මාර්තු 16 වන දින බුවනෙක නම් ඇතා වෙඩි තබා මරන ලද බව The අලියා - Elephant පිටුව වාර්තා කර ඇත (The Elephant, 2023).

***විදුලි සැර වැද්දවීම නිසා සිදුවන අලි මරණ***

අලි මිනිස් ගැටුම ප්‍රබල වීම මිනිසා කුපිත කරවයි. වෙඩි තැබීම් වලට සමාන ප්‍රතිශතයකින් වල් අලි මිය යෑම විදුලි සැර වැද්දවීම මගින්ද සිදුව ඇති බව මෙම දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි වේ.

2023 /09/ 24 වන දින මුලතිව් පුදුකුඩිරිප්පු මන්නංකණ්ඩාල් ප්‍රදේශයේ දී අලියෙක් මරණයට පත්වූ බව The Elephant appreciation Society (TEAS) කණ්ඩායම වාර්තා කරයි. මෙම වසරේ අගෝස්තු 08 වන දින අනවසර විදුලි සැර හේතුවෙන් පොළොන්නරුව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථාන දෙකකදී අලි දෙදෙනෙක් මරණයට පත්ව ඇත. මීට අමතරව විදුලි සැර වැදීම නිසා රිටිගල ඇතා, දනුද්ධර, රේවත, හරණ යන අලි ඇතුන් ජීවිතක්ෂයට පත් කිරීමේ සිදුවීම් වාර්තා විය (The Elephant appreciation Society, 2023).

2023/10/23 වන දින Centre for Environmental Justice පිටුවෙහි වාර්තා වී ඇති අන්දමට පොළොන්නරුව සිරිපුර රන්කෙත්ගම වෙල් යායට මයිම් ඉඩමක අනාරක්ෂිත විදුලි වැටක ගැටීමෙන් 22 අළුයම ජීවිතක්ෂයට පත්වූ අලියෙකුගේ සිරුරක් කොටස්වලට කපා ගෙවත්තේ වළ දමා ඇති බව වැඩිදුරටත් දක්වා තිබුණි (Centre for Environmental Justice, 2023).

වන අලි අනතුරට ලක්වීම පිළිබඳ වාර්තා

*ප්‍රස්ථාර අංක 02 : වන අලි අනතුරට ලක්වීම පිළිබඳ වාර්තා*




(මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත, 2023)

අලින් අනතුරට පත්වීම පිළිබඳ පුවත් සලකා බැලීමේදී ඒ ද ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ නිරීක්ෂණය කිරීමට හැකි විය. අලි ඇතුන් බොහෝ ලෙස අනතුරට ලක්ව ඇත්තේ වෙඩි වැදීමෙනි. එය 22% ක් ලෙස නිරූපණය කර ඇත.

***වෙඩි තැබීම් නිසා අලි අනතුරට ලක්වීම***

ඉකුත් සැප්තැම්බර් 30 වන දින අලුයම සිදුවූ මහරගම සීතාට වෙඩි තැබීමේ සිදුවීම මේ දිනවල ප්‍රබල ලෙස සාකච්ඡාවට බඳුන් වූ සිදුවීමකි. මහියංගනය පෙරහැර නිමවී බැඳ සිටි ඇතින්නට වනජීවී නිලධාරීන් වෙඩි තබන ලදී. යකඩ මුනිස්සම් සීතාගේ සම පසාරු කරගෙන ගොස් ඇති අතර තවමත් සීතා ප්‍රතිකාර ලබමින් සිටින බව The breath - හුස්ම පිටුවෙහි වාර්තා වී ඇත. තවද 2023/07/29 දින නාන්නේරිය වැවර වැටිය වැව් ඉස්මත්තේ දී අලියෙකුගේ වම් කකුලට වෙඩි වැදී ඇත (The breath, 2023).

Advocate for Sri Lanka Wild Elephants - අපේ වන අලි වෙනුවෙන් සටන් කරමු කණ්ඩායම වාර්තා කර ඇති ආකාරයට අප්‍රේල් 19 වන දින කෝණමඩුව වැවේ මරණාසන්නයේ වෙඩි වැදුණු අලියෙක් සිට ඇති අතර ඒ වන විටත් වනජීවී නිලධාරීන් කිසිවකු එහි පැමිණ නැති බව ද වාර්තා වේ (Advocate for Sri Lanka Wild Elephants, 2023).

***බඳින තුවක්කු නිසා සිදුවන අලි අනතුරු***

බඳින තුවක්කු නිසා පීඩා විඳින විඳින අලි ඇතුන් පිළිබඳව ද විවිධ පුවත් විවිධ ප්‍රදේශවලින් හමුවී ඇත. අග්බොගේ සිදුවීම වර්තමානයේ සුලබව සෑම පිටුවකම වාගේ සාකච්ඡාවට බඳුන් වන්නකි. 2023/07/18 දින Sri Lanka Elephant පිටුවෙහි පළ වන ආකාරයට මීට මාස කිහිපයකට පමණ පෙර බඳින තුවක්කුවකට හසුවී වම් පාදයේ තුවාලයක් සහිතව සහිතව ජීවත් වූ අග්බෝ ඇතා මහත් පරිශ්‍රමයකින් අල්වාගෙන ප්‍රතිකාර කරමින් සිටියි (Sri Lanka Elephant, 2023). අටවන ලද මද්දකට හසුවූ උඩවලවේ නාමල්ට කෘත්‍රිම පාදයක් සවි කර ඇති ආකාරය Save Sri Lankan Elephants කණ්ඩායමෙහි ප්‍රදර්ශනය කර ඇත (Save Sri Lankan Elephants, 2023).

***හක්ක පටස් හේතුවෙන් සිදුවන අලි අනතුරු***

හක්ක පටස් හේතුවෙන් බොහෝ අලි පීඩා විඳින බව පුන පුනා පැවසිය යුතු නැත. Sri Lankan Elephant Protectors කණ්ඩායමෙහි 2023/01/19 වන දින වාර්තා වූ සිද්ධියක් ලෙස, අම්පාර බුද්ධංගල ප්‍රදේශයේ අලි

පැටවාගේ සිද්ධිය දැක්විය හැකිය. හක්පටස් කා කුණු වලෙහි කුසගින්න නිවා ගැනීමට උත්සාහ කරමින් සිටිනු මෙහිදී දැකගත හැකි විය (Sri Lankan Elephant Protectors, 2023).

***ගෘහස්ථ හස්තීන් රැකබලා ගැනීමේදී සිදුවන නොසැලකිලිමත් බව නිසා සිදුවන අනතුරු***

හස්තීන් රැකබලා ගැනීමේදී සිදුවන නොසැලකිලිමත් බව පිළිබඳව සාකච්ඡා කිරීමේදී, Thambapanni පිටුවෙහි මෙසේ පුවතක් පළ වී තිබුණි. ඒ මුතුරාජාගේ සිදුවීමයි. මුතුරාජා අලුත්ගම කන්දේ විහාරයට පූජා කළේ තායිලන්ත රජයෙනි. හස්තියාගේ ඉදිරි පාදයක් නැමීමට නොහැකිවීම මෙන්ම ශරීරයේ තුවාල කිහිපයක් ද දක්නට ලැබුණි. පසුව හස්තියා දෙහිවලට රැගෙන ආ අතර තායිලන්තයේ ඇත් ගොව්වෙක්ද පැමිණියේය. හස්තියා සුව කරගැනීම සඳහා ලංකාව උත්සාහ දැරුවද බලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය හේතු කොටගෙන තායිලන්ත රජය විසින් හස්තියා රැගෙන ගොස් සුව කිරීමට කටයුතු කරන ලදී. මෙහි වාර්තා වී ඇති ආකාරයට මුතුරාජා ඉතා හොඳින් සුවය ලබමින් පසුවන බව වැඩිදුරටත් සඳහන් වී ඇත (Thambapanni, 2023).

***අලි-මිනිස් ගැටුම සම්බන්ධයෙන් වාර්තාවන මිනිස් මරණ***

අලි මිනිස් ගැටුමේ බලපෑම අලින්ට පමණක් නොව මිනිසාට ද ප්‍රබලව බලපානු ලබයි. වන අලි පහරදීම නිසා සිදුව ඇති මිනිස් මරණ 20% කි. අලි මරණවලට සාපේක්ෂව මිනිස් මරණ ද  මෙම පිටුවල සහ කණ්ඩායම්වල වාර්තා වී ඇත. මිනිස් මරණ, තුවාල ලැබීම් පිළිබඳ වාර්තා වී ඇති සිදුවීම් අලි මරණවලට වඩා අඩුය. ඒවා විටෙක අලි මරණ වලට වඩා දරුණුව සිදුවුවත් මිනිසුන් විශාල ලෙස කතා කරන්නේ අලි ඇතුන්ගේ මරණ සහ අනතුරු පිළිබඳව බව හඳුනාගත හැක. තුවාල ලැබීම්ද මෙසේ වාර්තා වී ඇත්තේ 1% ක ප්‍රතිශතයකි. වන අලි පහරදීම හේතුවෙන් 2023/08/25 වන දින වන ජීවී නිලධාරියෙක් ජීවිතක්ෂයට පත්ව ඇති බව අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු පිටුවේ සටහන් වී ඇත. 2023/05/25 දින ප්‍රදේශ කිහිපයක වන අලි පහරදීම් නිසා පුද්ගලයින් තිදෙනෙක් මරණයට පත්ව ඇති බව අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු පිටුව වාර්තා කර ඇත. ඒ අරලගංවිල, තන්තිරිමලේ, හදපානාගල යන ප්‍රදේශවලිනි (අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු, 2023).

2022/09/27 වන දින පැය 24 ක් තුළ එප්පාවල පොලිස් වසමේ ස්ථාන දෙකකදී එල්ල වූ වන අලි ප්‍රහාරවලින් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්ව ඇති බව ගජ මිතුරෝ කණ්ඩායමෙහි සඳහන් විය. ඉන් එක් අයෙකු දර කැඩීමට ගොස් සිටියදී ප්‍රහාරයට ලක්ව ඇති අතර, අනෙකා මාර්ගයේ ගමන් කරමින් සිටියදී මෙසේ වන අලි ප්‍රහාරයෙන් ජීවිතක්ෂයට පත්ව ඇත (ගජ මිතුරෝ, 2023).

***දේපළවලට හානි කිරීම***

මිනිසුන් වැඩි වශයෙන් කුපිතව සිටින්නේ අලියා මිනිසුන්ගේ දේපළවලට හානි කිරීම නිසා ය. වන අලි ගම් වැදීමේ දී නිවාස වලට වගා කටයුතුවලට දේපළ වලට හානි සිදුවීමේ පුවත් පිළිබඳවද සමාජ මාධ්‍ය තුළ කතා බහට ලක් වූ බව පෙනී ගියේය.

2022/04/19 අනුරාධපුර, තඹුත්තේගම, මලියදේවපුර, කොත්මලේ, ගම්මාන්වල වගා බිම් හා නිවාසවලට වන අලි ප්‍රහාර එල්ල වී ඇති බව Voice for Elephants කණ්ඩායම වාර්තා කර ඇත (Voice for Elephants, 2023). තවද, 2023/03/03 වන දින අස්වැන්න නෙළීමට තිබූ කුඹුරක් විනාශ කිරීමේ ඛේදජනක සිදුවීමක් මිනිස් ජීවිත, වන අලින්, වනජීවීන් හා බෝග වගාවන් සුරැකීමේ සංවිධානය පිටුවෙහි සටහන් වී තිබුණි. තවද, 2023/08/17 වන දින අනුරාධපුර ගලෙන්බිඳුනු වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිවැව ප්‍රදේශයේ පොල්, කෙසෙල්, බඩඉරිඟු, බණ්ඩක්කා, පේර, අඹ වගාවන් විනාශ කර දැමීමේ සිද්ධියක් ද මෙහි සඳහන් වී තිබුණි (මිනිස් ජීවිත, වන අලින්, වනජීවීන් හා බෝග වගාවන් සුරැකීමේ සංවිධානය , 2023).

***හීලෑ අලි සම්බන්ධ වාර්තා***

හීලෑ අලි සම්බන්ධ බොහෝ සිදුවීම් ද මෙසේ සටහන් විය. අලි පැටව් සොරකම් කිරීම විශාල වශයෙන් සිදු වන්නකි කුඩා අලි පැටව් පෙරහර කටයුතු වලට යොදා ගැනීමට රැලෙන් පන්නාගෙන එන්නේ කුඩා කාලයේදීය. එසේ සොයා ගොසින් වද හිංසා කරමින් පුරුදු පුහුණු කටයුතු සිදුකරයි. අලියාගේ නිජභූමිය වනාන්තරයයි. නමුත්,  පෙරහර කටයුතුවලට සුලබව අලි ඇතුන් යොදා ගැනීම නිසා ඇතැම් අලින්ට වාස භූමිය අහිමිව ගොසින් ය. පෙරහර අවස්ථාවල හීලෑ අලි ඇතුන් ද කුලප්පු වූ අවස්ථා බොහෝ ලෙස සමාජ මාධ්‍යයේ පළ වුණු බව දනිමු. මහනුවර ඇසළ පෙරහරේ අලි කුලප්පු වීම් විවිධ පිටුවල වාර්තා කෙරුණි.

තවද පෙරහර ගමන් ගන්නා අතරතුරද හීලෑ අලි ඇතුන්ට වද හිංසා පැමිණවීමේ පුවත් වාර්තා විය. පෙරහැර කටයුතු සඳහා හීලෑ අලි යොදාගැනීමේ පුවත් නම් වාර්තා වූයේ අසීමිත ලෙසටය. නිදසුන් ලෙස, ගෙඩිගේ පෙරහැරට අලි ඇතුන් සූදානම් කිරීමේ අවස්ථාවක් හීලෑ අලි ඇත්තු - Sri lankan Tamed Elephants පිටුවෙහි සඳහන් වූ අතර, බොහෝ පිටු සහ කණ්ඩායම්වල නුවර පෙරහැරට අලි ඇතුන් සරසන ආකාරය, පුහුණු කරන ආකාරය, පා ගමනින් නුවරට ගෙන එන ආකාරය යනාදී බොහෝ කරුණු සටහන්ව තිබුණි (හීලෑ අලි ඇත්ත, 2023). මේවා අලි ඇතුන්ගේ ප්‍රයෝජන ලෙස දැක්විය හැකිය. එක් අතෙකින් මේ ක්‍රියාකරකම් හස්තීනිගේ නිදහස නැති කරන බව යමෙකු ප්‍රකාශ කරයි. තවද, අලි ඇතුන් නොමැතිව පෙරහැරකින් ඵලක් තිබේදැයි තවකෙකු විමසයි.

කැබිලිත්තේ ආරක්ෂකයාට හිංසා කිරීමේ පුවත් මෑතකාලයේ දිගින් දිගටම වාර්තා විය. සෙල්ෆි ඡායාරූප ගැනීම, ඇතාට හිංසා, පීඩා වන සේ වන හැසිරීම් සමාජ මාධ්‍යයේ බොහෝ කණ්ඩායම් තුළ පිළිකුලෙන් යුතුව හෙළා දැක ඇත. 2023/08/22 දින රුහුණු කතරගම දේවාලයේ පෙරහැර අතරතුර අලියෙක්ට පහරදෙන වීඩියෝවක් Ali Wadiya - අලි වාඩිය කණ්ඩායමේ සටහන්ව තිබුණේ හදවත් කම්පාවන අන්දමටයි (Ali Wadiya, 2023). 2023/07/23 දින පානදුර දළදාවත්ත පෙරහැරේදී වැව්ට බණ්ඩාර අලියා නොන්ඩි ගසමින් පෙරහැරේ ගමන් කරන දර්ශනයක් සඳහන් ව තිබුණි. කටු දම්වැල් දමා බලෙන් ආබාධිත අලි පෙරහැරේ දක්කාගෙන යන දර්ශනයක් හස්ති රාජ පරපුර පිටුවෙන් අනාවරණය වී තිබුණි (හස්ති රාජ පරපුර, 2023).

***අලි සංරක්ෂණ සහ කළමනාකරණ උපායමාර්ග පිළිබඳ වාර්තා***

අලි සංරක්ෂණ සහ කළමනාකරණ උපායමාර්ග පිළිබඳව කතිකාවක් මේ දිනවල වැඩි ලෙස කතාබහට කතාබහට ලක්වන මාතෘකාවක් වී ඇත්තේ ය. මන්දයත්, දිනකට වන අලි මරණ, අනතුරු වර්තමානය  වනවිට ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති හෙයිනි.

විවිධ සංරක්ෂණ කළමනාකරණ උපායමාර්ග පිළිබඳව සමාජ මාධ්‍ය තුල වැඩි අවධානයට ලක්ව ඇත්තේය. අලි කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස විදුලි වැට භාවිතා කිරීම පිළිබඳව සඳහන් කිරීමේදී එය වියළි කලාපයන්හි බහුලව භාවිතා වන බව හොඳින් දන්නා කරුණකි. වන ජීවය මගින් පරිපාලනය වන, වන ජීවී රක්ෂිත ප්‍රදේශවලට අලි ඇතුන් සීමා කිරීම, අලි ගහන ප්‍රදේශ සිතියම්ගත කිරීම, අලි සහ මිනිසුන්ට වාසය කළ හැකි ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම, ගම් හා රක්ෂිත වෙන් කොට විදුලි වැටවල් ඉදිකිරීම, අලින්ගේ වාසයට සුදුසු රක්ෂිත සැකසීම, අලින් අකමැති ගස්වලින් වැටවල් ඉදිකිරීම (පතොක්), සැර මිරිස් වර්ග වගා කිරීම (ගොවීන්ට අමතර ආදායමක් ද ලැබේ), උක්, පැණි පුහුල් වැනි පැණි රස ආහාර වන අලි ප්‍රහාර වලට ලක්වන ප්‍රදේශවල වගා නොකිරීම වැනි ක්‍රම අලි සංරක්ෂණ උපාය මාර්ග වශයෙන් විවිධ පිටු සහ කණ්ඩායම්වල වාර්තා කර තිබුණි. 2006 වියළි කාලයේදී වලව වම් ඉවුර ව්‍යාපෘතිය මගින් පාරම්පරික නිජබිම උදුරාගෙන අලි 225 ක් ලුණුගම්වෙහෙර වනෝද්‍යානයට ගාල් කරන ලදී.  අගල් කැපීම මගින් ද මෙම ගැටුම කළමනාකරණයට විසඳුම් සෙවීම පිළිබඳව විවිධ පුවත් වාර්තා වී ඇත. 2023/04/09 වන දින, අලි සංරක්ෂණය සඳහා සත්ත්ව හුවමාරු උමං නිර්මාණය පිළිබඳ පුවතක් අලි මිනිස් ගැටුමට විසඳුමක් පිටුවෙහි සටහන් වී තිබුණි (අලි මිනිස් ගැටුමට විසඳුමක්, 2023). අලි ගාල්, තරුණයන් එකතු කිරීමේ වැඩසටහන් පිළිබදව, විරෝධතා සංවිධානය, අලි අභිජනන මධ්‍යස්ථාන (කැස්බෑව), අලි වැට එන්ජයිසර් ආදිය පිළිබඳ සටහන් විවිධ පිටුවල වරින් වර වාර්තා වී තිබුණි.

තවද අලි ගැටලුව විසඳීමට වන අලි රක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, ඉඩම් අමාත්‍යංශය රයන ආයතන වගකීමෙන් කටයුතු කළ යුතු බවත් වරින් වර මෙම පිටුවල සඳහන් කර තිබුණි. ප්‍රජා මූල විදුලි වැට ඉදි කිරීමෙන් අලි ගම්මාන, කුඹුරු වෙත වන අලි පැමිණීම වැලැක්විය හැකි බව දක්වා තිබුණි. අලි ඇතුන්ට GPS චන්ද්‍රිකා තාක්ෂණ පටි පැළඳවීම මගින් ඔවුන්ගේ හැසිරීම් රටා පිළිබඳව අඛණ්ඩව දත්ත ලබා ගත යුතු බවත්, සංවර්ධන සැලසුම් සැකසීමේදී වන අලින්ගේ වාස භූමි හා සංචරණ රටාවන් සැලකිල්ලට ගත යුතු බව මෙන්ම ඩ්‍රෝන මගින් පරීක්ෂා කිරීමෙන් අලින් පලවා හැරීමට උපක්‍රම යෙදිය හැකි බවත් Sri Lanka Road Elephant Research කණ්ඩායම දක්වා තිබුණි (Sri Lanka Road Elephant Research, 2023). චලන චක්‍රීය ප්‍රොපේන් කාලතුවක්කුව නම් උපකරණයක් මගින් අලින් පලවා හැරීමට උත්සාහ දැරිය හැකි බව අලි මිනිස් ගැටුමට විසඳුමක් කණ්ඩායම සඳහන් කර තිබුණි. තවද, කුඹුරු අද්දර කටු සහිත ගස් වැවීම, ගොවිපල සමීපයේ මී මැස්සන් බෝ කිරීම වැනි විසඳුම් ද අලි රකින මිනිස් දම්වැල  පිටුවෙහි තව දුරටත් සඳහන් වී තිබුණි.

***අලි පිළිබඳ අතීත වාර්තා***

අලි ඇතුන් පිළිබඳව ඉතිහාස වාර්තා විවිධ අයුරින් හුවමාරු විය. අලි වෙන්දේසිය පිලිබඳව අතීත වාර්තා පිටුවල හුවමාරු වී තිබුණි. 2022/10/11 වාර්තා වූ පුවතක් අනුව අතීතයේ දවසක අලි පැටවෙකු වැඩිහිටි ඇතෙකු යොදාගෙන පුහුණු කරන අවස්ථාවක් දක්නට ලැබුණි. 2023/05/01 වන දින පළවූ ඉතිහාස වාර්තාවක් හස්ති රාජ - Hasthi Raja පිටුවෙන් සොයාගැණුනි (හස්ති රාජ, 2023). මෙය රාජා ඇතා, නවම් රාජා වැනි ඇතුන් පිළිබඳව සඳහන් කරමින් සටහන් කර තිබූ සටහනකි. 2023/04/16 වන දින නැසීගිය දළ ඇතුන් පිලිබඳ ඓතිහාසික වාර්තාවක් Living with Elephants කණ්ඩායමේ දක්වා තිබුණි (Living with Elephants, 2023). 2023/07/12 වන දින ලංකාවේ ඇත්තු අඩු ඇයි? නමින් ඉතිහාස වාර්තාවක් හස්ති පරපුරේ අභිමානය පිටුවෙහි වාර්තා කර තිබුණි. තවද, 2023/01/31 වන දින නවනාරී කුඤ්ජරය නමින් ඉතිහාස වාර්තාවක් සටහන් වී ඇත. වසර 1993 දී මාර්ග සංවර්ධනයට යොදාගත් අලි ඇතුන් පිලිබඳ අතීත වාර්තාවක් Voice for Elephants Sri Lanka පිටුවෙහි වාර්තා වී ඇත (Voice for Elephants Sri Lanka, 2023).

***අලි ඇතුන් පිළිබඳ පර්යේෂණ වාර්තා***

2023/04/25 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යායාලයේ ඉංජිනේරු තාක්ෂණ පීඨයේ ශිෂ්‍යාවන් පිරිසක් අලි ඇතුන් සන්නිවේදනය කිරීමේදී භාවිතා කරන අති ධ්වනි තරංග (Infrastrucutre emissions) ආශ්‍රයෙන් අලි ඇතුන් සිටින ස්ථාන හඳුනාගැනීම යන තේමාව යටතේ පින්නවල අලි ඇතුන් ආශ්‍රයෙන් පර්යේෂණයක් සිදුකර ඇත. 2023/04/30 වන දින අලි ඇතුන් සන්නිවේදනයට යොදාගන්නා ධ්වනි තරංග හඳුනාගැනීමේ පර්යේෂණයක් සංජු අලියා යොදාගනිමින් අලි මිනිස් ගැටුම පාලනයට කටයුතු කර ඇති බව ද මෙහි සඳහන් විය (Voice for Elephants Sri Lanka, 2023).

2023/10/23 වන දින Manik Elephant Protection Foundation කණ්ඩායමේ සටහන් වූ ලිපියකට අනුව පරිසරයේ කාබන් සනත්වය පවත්වාගෙන යාමට අලියාගේ දායකත්වය නමින් පර්යේෂණ පත්‍රිකාවක් දක්නට ලැබුණි (Manik Elephant Protection Foundation, 2023). අලි සම්බන්ධ නීති ප්‍රතිපත්ති යෝජනා පිළිබඳව වරින් වර සමාජ මාධ්‍ය තුළ විවිධාකාරයේ පුවත් වාර්තා විය. වර්තමානය වන විට අලින්ගේ චර්යාත්මක වෙනස්කම් රාශියක් සිදුවී ඇති බව පෙනේ. වනාන්තර එළිපෙහෙළි කිරීමත් සමඟ මංමාවත්වල රැඳී සිටිමින් මග දෙපස සිට වාහන නතර කර බලහත්කාරයෙන් ආහාර ගැනීම, මාර්ග බාධක ලෙස ක්‍රියා කරන ආකාරයේ සිද්ධීන් නිරන්තරයෙන් වාර්තා වේ.
උදා:- බුත්තල-කතරගම මාර්ගයේ ගැවසෙන වන අලි

වනය එළි කිරීම නිසා වනය වනය තුළ ආහාර හිඟතාවය ඇතිවේ. නගරයට ගම්මාන වලට කඩා පැන හමුවන දෙයක් කෑමට වන අලි හුරු පුරුදු වී ඇත. කුණු කසල ආහාරයට ගැනීමෙ සිද්ධි බොහොමයක් මෙසේ වාර්තා වී තිබුණු අතර, 2023/04/21 වන දින මාර්ගයක දමා ගිය කුණු බෑගයක් වන අලියෙක් විසින් ආහරයට ගන්නා ආකාරය Habitats for Elephants කණ්ඩායම වාර්තා කර තිබුණි (Habitats for Elephants , 2023). රූපවාහිනී පුවත් පිටුවෙහි ගල්ගමුව, සියඹලන්ගමුව, මීගලෑව වැනි ප්‍රදේශවල සැරිසරන චණ්ඩි (තනි දලයා), කැලෑවල සඟවා ඇති ගෝඩා පානය කර වැව් වලට බැස කාලය ගත කරන බව වාර්තා කර තිබුණි (රූපවාහිනී පුවත්, 2023). ගිනි කෑම, නළ ළිං වලින් වතුර බීම ආදී සිද්ධි ද Ceylon Tuskers පිටුවෙහි සටහන් ව තිබුණි (Ceylon Tuskers, 2023). වෙනස් වන පරිසර තත්ත්වයන්ට මෙසේ අනුගතව ඇති අන්දම ප්‍රකාශ කරන පුවත් ද නෙත ගැටුණි.

***මුහුණු පොතේ පිටු සහ කණ්ඩායම් තුළින් හමුවන සාවද්‍ය පුවත්***

පුවත්වල භාෂා භාවිතය ද සැලකිලිමත් විය යුතු කරුණකි. ඇතැම් අවස්ථාවල සමාජ මාධ්‍ය තුළින් සාවද්‍ය පුවත් ද අනාවරණය වී ඇති බව මෙම වාර්තා මගින් තහවුරු විය. 2023/04/23 වන දින පොළොන්නරුව මහියංගන මාර්ගයේ 58 km කණුව අසල මඩ වගුරක එරී සිටි හස්තියෙකු මුදාගැනීමට වන ජීවී දෙපාර්තමේන්තුවේ කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බවට ප්‍රකාශ කරමින් පළ කර තිබූ පුතකත් පිලිබඳව වාර්තාව අසත්‍ය එකක් බව Voice for Elephants Sri Lanka පිටුව තුළ දක්වා තිබුණි. ඒ වන විටත් වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම අලියාගේ ප්‍රතිකාර ආරම්භ කර තිබූ බව තවදුරටත් දක්වා තිබුණි (Voice for Elephants Sri Lanka, 2023). වැල්ලවාය ප්‍රදේශයේ පාදයක ආබාධයක් සහිත අලියෙකු පිලිබඳව සටහනක් සංසරණය වූයේ වන ජීවී දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ නොකර ඇති බව සඳහන් කරමිනි. නමුත්, ඒ වන විටත් ඔවුන් ඒ ඇතාට ප්‍රතිකාර සිදුකරීමට ආරම්භ කොට ඇති බව අනාවරණය විය.

අලි-මිනිස් ගැටුමේ බලපෑම් මෙසේ සංක්ෂිප්ත සටහනක් ඔස්සේ ඉදිරිපත් කළ හැක.

**ප්‍රස්ථාර අංක 03: අලි-මිනිස් ගැටුමේ බලපෑම්**




(මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත, 2023)

**ප්‍රස්ථාර අංක 04 : අලි-මිනිස් ගැටුමේ බලපෑම්**




(මුලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත, 2023)

**අලි මිනිස් ගැටුම සමාජ මාධ්‍ය වල පල කිරීමේ අරමුණ සහ ප්‍රතිඵල හඳුනා ගැනීම**

මිනිසුන් විවිධ හේතූන් මත අලි ඇතුන් ගැන පලකිරීම සිදුවේ. අලි ඇතුන් බුද්ධිමත්, සමාජශීලී සහ සංවේදී සතුන් වන අතර, ඔවුන් බිය සහ ප්‍රශංසනීය හැඟීම් ඇති කරයි. අලි ඇතුන් පිළිබඳ පලකිරීම්, බෙදා ගැනීම ඔවුන්ගේ සංරක්ෂණ තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම, සත්ත්ව සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හෝ පුද්ගලයන්ට මෙම තේජාන්විත ජීවීන් කෙරෙහි ඔවුන්ගේ ආදරය ප්‍රකාශ කිරීමේ මාර්ගයක් විය හැකිය. මීට අමතරව, සමහර පල කිරීම් මගින් අලි ඇතුන් කෙරෙහි උනන්දුවක් දක්වන අන් අය සමග තොරතුරු බෙදා ගැනීමට මිනිසුන් දිරිගන්වන රසවත් කරුණු, සංරක්ෂණ උත්සාහයන් හෝ හද උණුසුම් කරවන කතා ඉස්මතු කළ හැකිය.

අලි මිනිස් ගැටුම වර්තමානයේ සුලබ හා නොනැවැත්විය හැකි දසුනක් බවට පත්ව ඇති බව විවිධ පුවත් ඔස්සේ එහිදී අනාවරණය විය. අලි මිනිස් ගැටුම සමාජ මාධ්‍ය තුළ පලකිරීමෙන් ගැටුම කොතෙක් දුරට උත්සන්න වී ඇත්දැයි අවබෝධයක් භාවිතා කරන්නාට ලැබේ. සංරක්ෂණය කළ යුතු වන්නේ ඇයි, සංරක්ෂණ අභියෝග, සංරක්ෂණ ක්‍රම ආදිය පිළිබඳව අවබෝධයක් ලබාදෙයි.

මෙසේ පලකිරීම නිසා අද වන විට මිනිස් මරණයන්ට වඩා වන අලි මරණ, අනතුරු පිළිබඳව කතා කිරීම සුලබ වී ඇති බව කිව හැකිය. වන අලි පිලිබඳව මිනිසා තුළ වූ සෘණාත්මක ආකල්පය ක්‍රමයෙන් ධනාත්මකව දිස්වේ.

***වාර්තා වූ පුවත් මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සිදුකරන බලපෑම***

අලි ඇතුන් සම්බන්ධ ගැටළු ඇතුළු විවිධ ගැටළු පිළිබඳව දැනුවත් කිරීම සඳහා ෆේස්බුක් සමාජ මාධ්‍ය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇති බව පෙනේ. මෙම වේදිකාව පුද්ගලයන්ට සහ සංවිධානවලට තොරතුරු, රූප සහ වීඩියෝ බෙදා ගැනීමට මාධ්‍යයක් සපයන අතර, විවිධ හේතූන් පිළිබඳ මහජන දැනුවත්භාවය සහ සැලකිල්ල වැඩි කරයි.

අලි ඇතුන් සම්බන්ධයෙන් දඩයම් කිරීම, වාසස්ථාන අහිමි වීම, කළමනාකරන උපක්‍රම සහ මෙම තේජාන්විත සතුන් සංරක්ෂණය වැනි කරුණු ඉස්මතු කිරීමට මෙම මාධ්‍ය ප්‍රයෝජනවත් වී ඇත. මෙහි පිටු සහ කණ්ඩායම් තුළින් බෙදාගත් වාර්තා, වීඩියෝ සහ පින්තූර අලි මුහුණ දෙන අභියෝග කෙරෙහි අවධානය යොමු කර ඇති අතර සාකච්ඡා, ක්‍රියාමාර්ග සහ කැඳවුම් වලටද පොළඹවා ඇත. අලි මරණ, අනතුරු, මිනිස් මරණ ආදිය පිලිබඳව සාකච්ඡා කිරීමට මෙමගින් විවෘත වේදිකාවක් සපයයි. ඒවා ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි බලපෑම් කර ඇති බව මෙම වාර්තා වැඩිදුර විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි විය. දැනුවත් කිරීම් සහ මහජන පීඩනය තීරණ ගන්නන්ට බලපෑම් කළ හැකි අතර, ප්‍රතිපත්ති වෙනස්කම් බොහෝ විට දේශපාලන, ආර්ථික සහ විද්‍යාත්මක සලකා බැලීම් ඇතුළත් සංකීර්ණ ක්‍රියාවලියකට ඇතුළත් වේ. නූතන සිදුවීමක් ලෙස විශාල ලෙස මුහුණු පොතේ සාකච්ඡා කළ සීතාට වෙඩි තැබීම පිළිබඳ පුවත ඉතා වේගයෙන් සංසරණය වූ අතර වරදකරුවන් නීතියේ රැහැනට හසු කරගන්නා තෙක් එහි අවධානය ගිලිහුනේ නැති බව අවබෝධ විය (The breath, 2023). තෝරාගත් වසරක කාලයක් තුළ අනාවරණය වූ සියලු සිදුවීම් මෙසේ සාකච්ඡාවලට බඳුන් වෙමින් ඒවාට එරෙහිව බලපෑම් එල්ල කිරීමට මෙම මාධ්‍ය පිටිවහලක් වූ බව කිව යුතුය.

***අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සමාජ මාධ්‍ය පුවත්වල බලපෑම කුමක්ද යන්න හඳුනා ගැනීම***

මාධ්‍ය මගින් කරන්නේ මිනිසුන් දැනුවත් කිරීමයි. මෙහිදී තෝරාගත් පිටු සහ කණ්ඩායම් වල පළවූ පුවත් මගින්ද මිනිසාට වන අලි පිලිබඳව අවබෝධයක් ලබාදෙමින්, අලි සංරක්ෂණය සඳහා මිනිසා පොළඹවයි. කුඩා දරුවාගේ සිට මහල්ලා දක්වා ඔවුනොවුන්ගේ සිත් තුළ කම්පාව ජනිත කොට වන අලි ගැටුම් කළමනාකරණයට මග සලසා ඇත. අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සමාජ මාධ්‍යයන්ට ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් ඇති කළ හැකිය. සමාජ මාධ්‍ය පුවත් මඟින් මෙම ගැටුම අවම කිරීම සඳහා බලපෑම් කර ඇති ආකාරය තෝරාගත් පිටු සහ කණ්ඩායම් තුළින් දැකගත හැකි විය.

අලි මිනිස් ගැටුම, එහි හේතු සහ එහි ප්‍රතිවිපාක පිළිබඳව සමාජ මාධ්‍ය මගින් දැනුවත් කර ඇත. එය අලි හැසිරීම්, සංක්‍රමණ රටා සහ සංරක්ෂණ ප්‍රයත්නයන් පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීමට, සංවේදනය සහ අවබෝධය වර්ධනය කිරීමට යොදාගෙන ඇත. සමාජ මාධ්‍ය මඟින් අලි නිරීක්ෂණය කිරීම් හෝ බෝග වැටලීම් පිළිබඳ සත්‍යය වාර්තා කිරීම, ගැටුම් අවම කිරීම, භෝග ආරක්ෂා කිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ට සහ බලධාරීන්ට ඉක්මනින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට මෙය උපකාර කරයි. අලි-මිනිස් ගැටුම සම්බන්ධයෙන් ප්‍රජා සාකච්ඡා සහ මැදිහත්වීම් සඳහා සමාජ මාධ්‍යවලට පහසුකම් සලසයි. අලි-මිනිස් ගැටුම අවම කිරීම අරමුණු කරගත් සංරක්ෂණ මුලපිරීම් සඳහා අරමුදල් රැස් කිරීම සහ සහාය සඳහා සමාජ මාධ්‍ය ප්‍රබල මෙවලමක් වී ඇත. මෙම මාධ්‍යයන් හරහා දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ පරිත්‍යාග ව්‍යාපාර ඵලදායී ලෙස සංවිධානය කරයි. තවද අලි මිනිස් ගැටුම සම්බන්ධව විරෝධතා සඳහා ජනයා ඒකරාශී කිරීම මෙන්ම පසුගිය දිනවල වැඩි වශයෙන් සිදුවූ අලි මරණ, අනතුරු වලට එරෙහිව විරෝධතා ව්‍යාපාර දියත් කිරීමට මෙම මාධ්‍යයන් මගින් විශාල බලපෑමක් සිදු කෙරුනි. අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා ශක්තිමත් රාජ්‍ය ප්‍රතිපත්ති සහ රෙගුලාසි වෙනුවෙන් පෙනී සිටීම සඳහා වේදිකාවක් ලෙස සමාජ මාධ්‍ය කටයුතු කරයි. මහජන පීඩනය සහ දැනුවත්භාවය වඩාත් විස්තීර්ණ සංරක්ෂණ ක්‍රියාමාර්ගවලට තුඩු දිය හැකිය.

සාරාංශයක් ලෙස, දැනුවත් කිරීම, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම, ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණ ප්‍රයත්නයන්ට සහාය වීම මගින් අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සමාජ මාධ්‍යවලට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව පෙනේ. කෙසේ වෙතත්, මෙම වේදිකා වගකීමෙන් යුතුව භාවිතා කිරීම සහ ධනාත්මක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා නිවැරදි තොරතුරු සහ ගෞරවනීය සංවාදයක් ප්‍රවර්ධනය කිරීම සහ ගැටුම් උත්සන්න කිරීම වෙනුවට ගැටුම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ.

**නිගමන සහ නිර්දේශ**

ශ්‍රී ලංකාව ආසියානු අලි ඇතුන්ගෙන් 10% ක් සහ ලෝක අලි ජනගහනයෙන් 2% ක් සඳහා වාසස්ථාන සපයයි. ලංකාවේ ඇස්තමේන්තුගත අලි ඝනත්වය 0.088 කි. කෙසේ වෙතත්, 2011 දී අලි ඇතුන් 5,787 ක් සිටි අතර අද වන විට එම සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ඇත (Blanc et al, 2007). වාසස්ථාන අහිමි වීම, ආහාර හායනය, වනාන්තර ප්‍රදේශ අතර කොරිඩෝ සම්බන්ධතා අඩුවීම සහ ඔවුන්ගේ ඓතිහාසික ප්‍රමාණයට හා පරාසයට සාපේක්ෂව අලි ගහනයේ සැලකිය යුතු අඩුවීමක් නව මිනිස් ජනාවාස නිසා ඇති වී ඇත. ග්‍රාමීය මිනිස් ජනගහනයේ ශීඝ්‍ර වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික ඉඩම් භාවිතය පුළුල් වීම මේ සඳහා ප්‍රබලව බලපා ඇති බව කිව හැකිය.

අලි මිනිසුන් සමඟ නිතර ගැටෙන අතර මිනිසුන් පුපුරණ ද්‍රව්‍ය, විෂ මිශ්‍ර ආහාර, වෙඩි තැබීම් සහ වෙනත් ක්‍රම යොදාගෙන අලි මරා දැමීමට උත්සාහ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර 30 තුළ අලි මිනිස් මරණ ඉහළ ගොස් තිබේ. 1991 සිට 2021 දක්වා අලි මරණ 5,954 ක් සහ මිනිස් මරණ 2,111 ක් වාර්තා වී ඇත. 2019 වසරේ වැඩිම අලි මරණ සංඛ්‍යාවක් වාර්තා වූ අතර සිදුවීම් 407ක් වාර්තා වී ඇත. අලි මිනිස් ගැටුම අවම කිරීමේ ප්‍රයත්නයන්හිදී, එය කිරීමේ පියවරවල කොටසක් ලෙස ශ්‍රී ලංකාව 2019 සහ 2020 දී විදුලි වැටවල් සඳහා ඕෘ මිලියන 2.47ක් වැය කර ඇති අතර, එහි මුළු දිග කිලෝමීටර් 4,756 ක (Sukumar, 2006). වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාර්ෂිකව අලි වෙඩි, විපතට පත් ජනතාවට වන්දි ගෙවීම, අලි අල්ලා ගැනීම සහ ස්ථානගත කිරීම, ගම්වලින් අලි ඇතුන් වනාන්තරයට එළවීම සඳහා වියදම් කරයි. එසේම, සාම්ප්‍රදායික අවම කිරීමේ ක්‍රම මගින් කටු අතු, ලී වැට, මී මැසි වැට, අලි මුරකුටි, මුරකාවල් සහ අගල් වැනි බාධක යොදා ගනිමින් කෘෂිකාර්මික ප්‍රදේශවලට අලි සංචරණය සීමා කිරීමට උත්සාහ කරයි. මේ පිළිබඳ බොහෝ වාර්තා සමාජ මාධ්‍යක් වන මුහුණු පොතේ පිටු සහ කණ්ඩායම්හි වසරක් තුල පලවූ පුවත් වලින් හෙළිදරව් විය.

එහිදී, පර්යේෂකයන්ගේ සහ සාමාන්‍ය මිනිසුන්ගේ පිටු සහ කණ්ඩායම්වල වැඩි ඉඩක් හිමිව ඇත්තේ අලි මරණ, අලි අනතුරු සඳහා බව නිරීක්ෂණය විය. අලි නිසා හානි වූ මිනිස් ජීවිත ගැන කතා කර නැතුවාම නොවේ. මේවා වැඩිමනක් මෙසේ සමාජ ගත කරන්නේ මිනිසාගේ මනසට වනජීවීන්ගේ වටිනාකම ඒත්තු ගැන්වීමට බව හැඟේ. හිතකාමී අලි සංරක්ෂණ සහ කලමාකරණ ක්‍රම මිනිසුන්ට හඳුන්වා දිය යුතුය. මෙම සත්ත්වයින්ගෙන් පරිසර තුලිතතාවයට වන දායකත්වය මිනිසාට පහදා දිය යුතුය. මේ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුලුව මොවුන් වෙනුවෙන් වගකිව යුතු රාජ්‍ය ආයතන සඳහා විශාල වගකීම් කොටසක් පැවරේ. අලි මිනිස් ගැටුම කළමනාකරණය ආර්ථික හා සංස්කෘතික සම්පතක් ලෙස පිළිගන්නා දිගුකාලීන ඉඩම් පරිහරණ සැලැස්මකට ඒකාබද්ධ කළ යුතුය. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම සඳහා ඉහළ අවකාශීය විභේදන චන්ද්‍රිකා දත්ත සහ GIS ආකෘති නිර්මාණය භාවිතා කිරීමෙන් පෝෂණ භූමියේ හරිතකරණයේ සෘතුමය උච්චාවචනය අනුව අලි ඇතුන්ගේ සංචලනය පිළිබඳව ප්‍රජාවන්ට දැනුම් දීමේ නව ක්‍රමවේද ද මෙහිදී භාවිතා කළ හැකිය. එවැනි පද්ධති ප්‍රජාවන්ට සුදුසු පූර්වාරක්ෂාවන් ගැනීමට සහ මිනිසුන් සහ අලි ඇතුන් අතර සෘණාත්මක අන්තර්ක්‍රියා අවම කිරීමට කාලය ලබා දීමෙන් ගැටුම් වැළැක්වීමට උපකාරී වේ. අලින්ගේ වාසභූමි සාරවත් කිරීම, මිනීමරු අලි වෙනත් ප්‍රදේශවලට ගෙන යාම, රක්ෂිත කලාප ආරම්භ කිරීම, අලි මංපෙත්/ මංකඩ පිහිටුවීම, සංරක්ෂණය සහ ආර්ථික සංවර්ධනය අනුබද්ධ කිරීම, රක්ෂිතවල සිදුවන මානව බලපෑම් අඩු කිරීම, ජෛව වැටවල් නිර්මාණය (Bio Fencing), මිනිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය වැනි ක්‍රමෝපායන් අලි මිනිස් ගැටුම අවම කිරීමටත්, අලි සංරක්ෂණය සහ කළමනාකරණය සඳහාත් භාවිතා කළ හැකිය. මෙයට තිරසාර විසඳුම් සෙවීම සඳහා විද්‍යාඥයින්, වනජීවී කළමනාකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, වනජීවී ලෝලීන්, රජයේ බලධාරීන් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් එක්ව ක්‍රියාශීලීව කටයුතු කිරීම මෙම අභියෝගය ජය ගැනීමට ඉවහල් වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අලි ඇතුන් සුරකිමු. (2023 October 11). https://www.facebook.com/groups/301050213242250/?ref=share&mibextid=NSMWBT

අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු. (2023 October 13). https://www.facebook.com/raresinhala?mibextid=ZbWKwL

අලි මිනිස් ගැටුමට විසඳුමක්. (2023 October 11). https://www.facebook.com/profile.php?id=100064283904995&mibextid=ZbWKwL

අලි මිනිස් ගැටුමට විසඳුමක්. (2023 October 18).
https://www.facebook.com/profile.php?id=100064283904995&mibextid=ZbWKwL

අලි ඇතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටිමු. (2023 October 13).
https://www.facebook.com/raresinhala?mibextid=ZbWKwL

අතපත්තු. ඩී., (2011). *ආර්ථික විද්‍යා ප්‍රවේශය.* කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාරත්න. එච්. කේ. එන්., (2011). *ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සහ මෑතකාලීන පාරිසරික අර්බුද.* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ගජ මිතුරෝ. (2023) October 11).
https://www.facebook.com/groups/456619589385882/?ref=share&mibextid=NSMWBT

තිලකරත්න. ඩබ්. එම්., (2000.) *ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තිරසර සංවර්ධනය සහ වන විනාශය.* පේරාදෙණිය සමාජීය විද්‍යා අධ්‍යයන කේන්ද්‍රය.

පරාක්‍රම. පී., (2006). *'හිත් පිත් නැති මිනිසුන්හමුවේ වැනසෙන අලි පරපුරේ කඳුළු කතාව'* මිහිමඬල, 07-21.

පරිසර ත්‍රස්තවාදියා. (2023 October 17).
https://www.facebook.com/profile.php?id=100064200815304&mibextid=ZbWKwL

මිනිස් ජීවිත, වන අලින්, වනජීවීන් හා බෝග වගාවන් සුරකීමේ සංවිධානය. (2023 October 11).
https://www.facebook.com/profile.php?id=61552069017758&mibextid=ZbWKwL

හස්ති පරපුරේ අභිමානය. (2023 October 10).
https://www.facebook.com/HasthiParapureAbimanaya?mibextid=ZbWKwL

හස්ති රජ - Hasthi Raja. (2023 October 11).
https://www.facebook.com/profile.php?id=100093968568642&mibextid=ZbWKwL

හස්ති රාජ පරපුර. (2023 October 11).
https://www.facebook.com/profile.php?id=100070087817647&mibextid=ZbWKwL

හීලෑ අලි ඇත්තු - Sri lankan Tamed Elephants. (2023 October 11).
https://www.facebook.com/profile.php?id=100066688445606&mibextid=ZbWKwL

ශ්‍රී ලංකාවේ අලි සහ ඇතුන්. (2023 November 11)
https://www.facebook.com/groups/363894217789720/?ref=share&mibextid=NSMWBT

Advocate for Sri Lanka Wild Elephants - අපේ වන අලි වෙනුවෙන් සටන් කරමු. (2023 November 01)
https://www.facebook.com/groups/435933257861880/?ref=share&mibextid=NSMWBT

Ali Wadiya - අලි වාඩිය. (2023 October 12).

https://www.facebook.com/groups/662024199314807/?ref=share&mibextid=NSMWBT

Bandara, R., & Tisdell, C. (2005). *Changing abundance of elephants and willingness to pay for their conservation*. *76*, 47–59. https://doi.org/10.1016/j.jenvman.2005.01.007

Blanc, J. J., & Barnes, R. F. (Eds.). (2007). *African elephant status report 2007: an update from the African elephant database* (No. 33). Iucn.

Centre for Environmental Justice. (2023 October 11). From ` https://www.facebook.com/CEJSriLanka?mibextid=ZbWKwL

Ceylon Tuskers. (2023 October 1). https://www.facebook.com/SrilankanTuskers?mibextid=ZbWKwL

Dunkin, R. C., Wilson, D., Way, N., Johnson, K., & Williams, T. M. (2013). *Climate influences thermal balance and water use in African and Asian elephants: physiology can predict drivers of elephant distribution*. Journal of Experimental Biology, 216(15), 2939-2952.

Everything for animals. (2023 October 11). https://www.facebook.com/profile.php?id=100046907720307&mibextid=ZbWKwL

Elephant Lovers. (2023 October 11) https://www.facebook.com/groups/752162949528763/?ref=share&mibextid=NSMWBT

Elephant Lovers Club. (2023 October 19). https://www.facebook.com/groups/806509047346818/?ref=share&mibextid=NSMWBT

Elephant Soul. (2023 October 18). https://www.facebook.com/wasgamuwa.soul?mibextid=ZbWKwL

Fernando, C., Weston, M., Corea, R., Pahirana, K., & Rendall, A. (2023). Asian elephant movements between natural and human-dominated landscapes mirror patterns of crop damage in Sri

Lanka. Oryx, 57(4), 481-488. doi:10.1017/S0030605321000971

Fernando, P., & Leimgruber, P. (2011). Asian elephants and seasonally dry forests. Ecology and conservation of seasonally dry forests in Asia, 151-163.

Gamage. D. and Aheeyar. A., 1998. *Economic and Social factors affecting land degradation in the Upper Mahaweli Catchment. Sri Lanka*: Environmental Action Project by Ministry of Forestry and Environmental.

Group Elephant Lovers. (2023 October 13) https://www.facebook.com/groups/712386502632647/?ref=share&mibextid=NSMWBT

Habitats for Elephants. (2023 October 15). https://www.facebook.com/groups/habitatsforelephants/?ref=share&mibextid=NSMWBT

Gunawansa, T. D., Perera, K., & Apan, A. (2023). The human-elephant conflict in Sri Lanka : history and present status. 3025–3052.

Katupotha, J., & Sumanarathna, A. R. (2016). *Behavioral Characterristics of Sri Lankan Elephants*. *August*, 159–167.

Köpke, S., Withanachchi, S. S., Pathiranage, R., Withanachchi, C. R., Ranasinghe, N. N., Senarathna, C. D., Schleyer, C., & Thiel, A. (2021). *Human – Elephant Conflict in Sri Lanka : A Critical Review of Causal Explanations*. 1–14.

Krishnan, K., & Braude, S. (2014). *The Effect of Visitor Group size on stereotypic behaviour and use of available space by captive asian elephant*s. GAJAH, 3.,

Living with Elephants. (2023 October 11).https://www.facebook.com/groups/livingwithelephants/?ref=share&mibextid=NSMWBT

Manik Elephant Protection Foundation. (2023 October 11). https://www.facebook.com/groups/1084819902463303/?ref=share&mibextid=NSMWBT

Newsfirst.lk. (2023 October 12). https://www.facebook.com/NewsfirstSL?mibextid=ZbWKwL

Pieris. R., (1976). Social Development and Planning in Asia. Abhinav Publication.

Perera, B. M. A. O. (2009). *The Human-Elephant Con fl ict : 30*, 41–52.

Shaffer, L. J., Khadka, K. K., Van Den Hoek, J., & Naithani, K. J. (2019). Human-elephant conflict: A review of current management strategies and future directions. *Frontiers in Ecology and Evolution*, *6*, 235.

Save Elephants. (2023 October 09).https://www.facebook.com/SaveElephantsLK?mibextid=ZbWKwL

Save Sri Lankan Elephants. (2023 October 11). https://www.facebook.com/groups/234408869903325/?ref=share&mibextid=NSMWB

Sri Lanka Road Elephant Research. (2023 October 09). https://www.facebook.com/groups/2369333123300641/?ref=share&mibextid=NSMWBT

Sri Lankan Elephant Protectors. (2023 October 11). https://www.facebook.com/groups/316179073305252/?ref=share&mibextid=NSMWBT

Sri Lankan Elephants. (2023 October 10).https://www.facebook.com/groups/2709765076008037/?ref=share&mibextid=NSMWBT

Sitompul, A. F., Griffin, C. R., Rayl, N. D., & Fuller, T. K. (2013). *Spatial and temporal habitat use of an Asian elephant in Sumatra. Animals,* 3(3), 670-679.

Sri Lanka Elephant. (2023 October 11) https://www.facebook.com/SriLankaElephant?mibextid=ZbWKwL

Sukumar, R. (2006). *A brief review of the status, distribution and biology of wild Asian elephants*. 1–8.

Thambapanni. (2023 October 11). https://www.facebook.com/ThambapanniEvents?mibextid=ZbWKwL

The අලියා :2023 October 11).https://www.facebook.com/thealiyaelephant?mibextid=ZbWKwL

The breath - හුස්ම (2023 October 11). https://www.facebook.com/profile.php?id=100093070144976&mibextid=ZbWKwL

The Elephant appreciation Society (TEAS). (2023 October 11). https://www.facebook.com/groups/appreciatelephants/?ref=share&mibextid=NSMWBT

The Voice for Elephants. (2023 October 11). https://www.facebook.com/groups/688859622042437/?ref=share&mibextid=NSMWBT

Voice for Elephants Sri Lanka. (2023 October 11). https://www.facebook.com/voiceforelephants.lk?mibextid=ZbWKwL

Williams, E., Carter, A., Hall, C., & Bremner-Harrison, S. (2019). *Exploring the relationship between personality and social interactions in zoo-housed elephants*: Incorporation of keeper expertise. Applied Animal Behaviour Science, 221, 104876.

Wong, E. P., Campos-Arceiz, A., Zulaikha, N., Chackrapani, P., Quilter, A. G., de la Torre, J. A., . .. & Saaban, S. (2021). *Living with elephants: evidence-based planning to conserve wild elephants in a megadiverse South East Asian country*. Frontiers in Conservation Science, 2, 682590.